**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය**

උපදේශක චක්‍රලේඛය 2004/පුස/02 (අ)(සංශෝධිත 2024)

**පළාත් පාලන ආයතනවලට සම්බන්ධ මහජන පුස්තකාලයන්හි "ඔක්තෝබර් - ජාතික කියවීමේ මාසය වැඩසටහන" ක්‍රියාත්මක කිරීම**

## 01. හැඳින්වීම

2004 වසරේ සිට සෑම වර්ෂයකම ඔක්තෝබර් මාසය ජාතික කියවීමේ මාසය ලෙස රජය මගින් ප්‍රකාශයට පත් කර ඇත. ඒ අනුව 2024 ඔක්තෝබර් මාසයට යෙදෙන ජාතික කියවීමේ මාසයට සමගාමීව කියවීම් ප්‍රවර්ධනය සඳහා **විශේෂ වැඩසටහන්** සහ **විශේෂ ව්‍යාපෘති** ක්‍රියාත්මක කරන මෙන් සියලුම මහජන පුස්තකාලවලින් ඉල්ලා සිටිනු ලැබේ. " **ලෝකය ජයගෙන ඇත්තේ කියවන මිනිසුන්ය** " යන තේමාව පදනම් කරගනිමින් මෙම වසරේ ජාතික කියවීමේ මාසය වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නියමිත ය .

## 02. ව්‍යාපෘති කමිටුව

මෙහිදී වැඩසටහන් සංවිධානය කිරීම සඳහා විවිධ අංශ නියෝජනය වන පරිදි ජාතික කියවීමේ මාසයේ ව්‍යාපෘති කමිටුවක් පත් කර ගැනීම වඩා සුදුසු වේ. දැනට පුස්තකාල කමිටුවක් තිබේ නම් එම කමිටුව මගින් හා පාඨක සමාජයේ සහභාගිත්වයෙන් මෙම කටයුත්ත සිදු කළ හැක. මේ සඳහා ප්‍රධාන මෙහෙයුම් කමිටුවක් පත්කර ගැනීම ද සුදුසු වන අතර එහි සංයුතිය පහත පරිදි විය යුතුය.

- ආයතන ප්‍රධානියා හෝ නියෝජ්‍ය ප්‍රධානියා - කමිටු සභාපති
- නාගරික ලේකම් හෝ පළාත්පාලන ආයතනයේ ලේකම් - උප සභාපති
- පුස්තකාලයාධිපති - කමිටු ලේකම්
- ප්‍රජා සංවර්ධන නිලධාරී
- ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සංස්කෘතික නිලධාරී
- පළාත් පාලන බල ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක
- ආසන්න පාසලක පුස්තකාලයාධිපති

## 03. ක්‍රියාත්මක කළ හැකි විශේෂ වැඩසටහන්

- අන්තර්ජාලය හා සමාජ මාධ්‍ය භාවිතයෙන් නිවැරදි තොරතුරු ගවේෂණය සම්බන්ධව පාඨකයා දැනුවත් කිරීමට සුදුසු ක්‍රියාකාරකම් සිදු කිරීම.
- තේමාවට අදාළව විවිධ තරඟ සංවිධානය කිරීම.
- බල ප්‍රදේශයේ සෑම නිවසක් ආශ්‍රිතවම ගෘහස්ත පුස්තකාල ආරම්භ කිරීම සඳහා සුදුසු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පුස්තකාලය හා මෙතෙක් සම්බන්ධ වී නොමැති පාඨකයන් හඳුනා ගෙන ඔවුන් සම්බන්ධ කර ගැනීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පුස්තකාල සාමාජිකත්වය පිරිනැමීම.
- තොරතුරු සාක්ෂරතා වැඩසටහන් සංවිධානය කිරීම.
- පාඨක ප්‍රජාව උදෙසා කියවීම සම්බන්ධ විශේෂ ක්‍රියාකාරකම් සිදු කිරීම.
- අන්තර් පුස්තකාල සහයෝගිතා වැඩසටහන් සිදු කිරීම.
- පුස්තකාල මුහුණු පොත (Facebook) ඔස්සේ විවිධ වැඩසටහන් පිළිබඳ ප්‍රසිද්ධිය ලබාදීම.
- පුස්තකාලය විසින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ වැඩසටහන් පිළිබඳ තොරතුරු විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය තුළින් ප්‍රචාරය කිරීමට කටයුතු කිරීම.
- පුස්තකාලය මගින් අන්තර්ජාලය හා සමාජ මාධ්‍ය හරහා පාඨක නිර්මාණ එළිදැක්වීමේ සංසද පිහිටුවීම.
- තිරසර සංවර්ධන ඉලක්ක (Sustainable Development Goals) සහ ඒවා සපුරාගැනීමට අදාළව ජනතාව දැනුවත් කිරීමට කටයුතු කිරීම.

- ළමයින්, විශේෂ අවශ්‍යතා සහිත පිරිස් වෙනුවෙන් කියවීම් වැඩසටහන් ක්‍රියාවට නැංවීම. ළමා නිවාස, වැඩිහිටි නිවාස, බන්ධනාගාර ආශ්‍රිතව ජංගම පුස්තකාල වැඩසටහන් සංවිධානය කිරීම.
- ප්‍රජාවගේ රසවින්දනය ඉහළ නැංවීම සඳහා රසවින්දනාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- අදාළ බල ප්‍රදේශයේ හොඳම පාඨකයා තේරීම.
- පාඨකයන්ගේ නිර්මාණශීලී අදහස් පුස්තකාල බිත්ති පුවත්පත/සඟරා මගින් ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසීම.
- වෙනත් නිර්මාණශීලී කියවීම් ප්‍රවර්ධන වැඩසටහන් සිදු කිරීම.
- අදාළ බල ප්‍රදේශයේ ජනතාවගේ වෘත්තීය හා තාක්ෂණික ක්ෂේත්‍රයන්හි දැනුම ඉහළ නැංවීම සඳහා වැඩසටහන් සංවිධානය කිරීම.
- වෙනත් සුදුසු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## 04. අරමුදල්

මේ සඳහා විශාල වශයෙන් මුදල් යෙදවීම් සිදු කිරීම අවශ්‍ය නොවේ. අරමුදල් සපයා ගැනීම අදාළ පළාත් පාලන ආයතනය මගින් හෝ පුස්තකාලය මගින් සිදු කළ හැකිය.

## 05. වාර්තාව සකස් කිරීම

සිදු කරන ලද සියලුම වැඩසටහන් පිළිබඳ පැහැදිලි ක්‍රමවත් වාර්තාවක් සකස් කර අදාළ පළාත් පාලන ආයතනයේ ප්‍රධානියාගේ නිර්දේශ සහිතව ***2025 පෙබරවාරි මස 28*** වන දින හෝ ඊට පෙර ***අංශ ප්‍රධාන, ව්‍යාප්ති සේවා අංශය, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, අංක 14, නිදහස් මාවත, කොළඹ 07*** යන ලිපිනයට එවිය යුතුය.

ජයග්‍රාහී පුස්තකාල තෝරා ගැනීම සඳහා මූලිකව සලකා බලනු ලබන වාර්තාව සකස් කිරීමේදී, ඉහත දක්වන ලද වැඩසටහන් ඇතුළුව කියවීම් ප්‍රවර්ධනය සම්බන්ධයෙන් සිදුකරන ලද වැඩසටහන් සඳහා පමණක් ලකුණු ලබාදීමේ ක්‍රමවේදයක් අනුගමනය කරනු ලැබේ. මුළු ලකුණුවලින් 75% ක් පුස්තකාලය විසින් සිදු කරන කියවීම් ප්‍රවර්ධන වැඩසටහන් සඳහා ද වෙනත් ප්‍රජා වැඩසටහන් සඳහා 25% ක ලකුණු ප්‍රමාණයක් ද හිමිවේ.

වාර්තාව සකස් කිරීමේදී පිටකවරය /පොතේ බැම්ම වැනි දේ සඳහා අමතර කාලයක් හා මුදලක් වැය කිරීම අවශ්‍ය නොවේ. පුස්තකාලය විසින් ජාතික කියවීමේ මාසයේ තේමාවට අනුව සිදුකරන ලද වැඩසටහන් සහ අදාළ වර්ෂය පුරා සිදුකළ වැඩසටහන්වල තොරතුරු වෙන් වෙන්ව **ඡායාරූප හා තහවුරු කළ හැකි වෙනත් සාධක සහිතව විධිමත් අයුරින්** ඉදිරිපත් කිරීම ප්‍රමාණවත්ය.

## 06. ඇගයීම

ජාතික කියවීමේ මාසය 2024 ඵලදායි වැඩසටහන් ඉටු කළ පුස්තකාල වෙත 2025 ජාතික කියවීමේ මාසය සම්මාන ප්‍රදානෝත්සවයේ දී සම්මාන හා සහතිකපත් පිරිනැමීමට කටයුතු කරනු ලැබේ. ඇගයීම් කටයුතු පුස්තකාල මට්ටමින් සිදුකරන බැවින් එක් එක් පළාත් පාලන ආයතන සතු මහජන පුස්තකාල හා ශාඛා පුස්තකාල වෙන් වෙන් වශයෙන් වාර්තා එවිය යුතුය.ජයග්‍රාහී පුස්තකාල හා ඇගයීම් ලබන පුස්තකාල පිළිබඳ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වේ.

මහාචාර්ය නන්ද ධර්මරත්න
සභාපති
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
14, නිදහස් මාවත,
කොළඹ 07


මහාචාර්ය නන්ද ධර්මරත්න
සභාපති
විමසීම් - දුරකථන අංකය - 0112-688855
ෆැක්ස් - 0112685201
විද්‍යුත් තැපැල - libdev@mail.natlib.lk
වෙබ් පිටුව - www.natlib.lk